දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033, 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය)
எனது இல) PA/EOH/FCAU/14/2017/VOL iii/2025
My No. )

ඔබේ අංකය)
உமது இல)
Your No. )

දිනය )
திகதி ) 5 . 08.2026
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
## Ministry of Health& Mass Media

විධාන අංකය;- EOHFS/FCAU/06/2023

සියලුම පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්වරුන්,
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
අධ්‍යක්ෂ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය,
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, මහ නගර සභාව කොළඹ / මහනුවර,
සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්,

<u>2026 ආහාර (ලේබල් කිරීමේ හා ප්‍රචාරය කිරීමේ ) නියෝග ක්‍රියාත්මක කිරීම - "ආහාර සවිමත් කිරීමේ නියෝග" සඳහා සහන කාලයක් ලබාදීම සහ "සෞඛ්‍ය හිමිකම්පෑම , පෝෂණ හිමිකම්පෑම්" සම්බන්ධ නියෝග යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේදී අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය.</u>

රජයේ අති විශෙෂ ගැසට් පත්‍ර අංක 2494/47 යටතේ 2026.06.26 දින ප්‍රකාශයට පත්කරන ලද 2026.07.01 දින සිට බලාත්මක වන 2026 ආහාර (ලේබල් කිරීමේ හා ප්‍රචාරය කිරීමේ ) නියෝගයෙහි, පහත නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් , 2025.06.25 වන දින පැවැත්වූ ආහාර උපදේශන කමිටුවේදී දීර්ඝ ලෙස සාකච්ඡා කර පහත තීරණ ප්‍රධාන ආහාර බලධරයා විසින් අහාර බලධරයන් හා බලයලත් නිලධාරීන් වෙත දැනුම්දීමට තීරණය කරන ලදි.

1- අහාර සවිමත් කිරීම සම්බන්ධ නියෝග සඳහා සහන කාලයක් ලබාදීම.
එම කමිටුවේදී පහත සඳහන් නියෝග දෙක ක්‍රියාත්මක කිරීමේදී ඇති ප්‍රායෝගික ගැටළු නිරාකරණය කරන තෙක් එම නියෝග බලාත්මක කිරීම සම්බන්ධයෙන් පමණක් 2026.07.01 දින සිට 2026.12.31 දින දක්වා මාස (06)ක කාලයක් ලබා දිමට තීරණය කරන ලදි.

නියෝග 13.(10) (අ) (II)
“ යම් පෝෂණ පදාර්ථයක සවිමත් කිරීමේ මට්ටම මෙහි IV වන උප ලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි නිර්දේශිත පෝෂණ අගයෙන් ( NRV) හෝ මෙහි VII වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති දිනකට අවශ්‍ය සමාන්‍ය අගයෙන් (AR) හෝ ප්‍රමාණවත් පාරිභෝජන අගයෙන් ( AI) තුනෙන් එකකට ( 1/3) වඩා වැඩි වී ඇත්නම්, එවැනි නිෂ්පාදනයක් අලෙවි කිරීමට පෙරාතුව , ප්‍රධාන ආහාර බලධාරීයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගනු ලැබිය යුතුය.”

නියෝග 13.(10) (ඈ) (ii)
" ඉහත අනු ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුවද මාස තිස් හයට අඩු ළමයින් සඳහා වන ආහාර සවිමත් කිරීමේදී ප්‍රධාන ආහාර බලධාරියාගේ පූර්වම ලිඛිත අනුමැතිය ලබා ගනු ලැබිය යුතුය"
ඒ අනුව, ඉහත සඳහන් මාස හය (06) ක සහන කාලය, ඉහත සඳහන් වගන්ති දෙක [13.(10) (අ) (ii) හා 13(10) (ඈ) (ii)] ක්‍රියාත්මක කිරීමට පමණක් අදාළවේ.

**II. " සෞඛ්‍ය හිමිකම්පෑම්, පෝෂණ හිමිකම්පෑම්" සම්බන්ධ නියෝග සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමේදී නැවත දැනුම් දෙන තුරු අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය.**

2026 (ආහාර ලේබල් කිරීමේ හා ප්‍රචාරය කිරීමේ) නියෝගයන්හි, පහත සඳහන් නියෝග 13(6) (අ) සහ 14 (1) පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරවමි.

නියෝග 13.(6) (අ)
" සෑම සෞඛ්‍ය හිමිකම්පෑමක් සහ පෝෂණ පදාර්ථ ක්‍රියාත්මකව හිමිකම්පෑමක්, එම හිමිකම්පෑම ආහාරයක ලේබලය මත ප්‍රදර්ශනය කිරීමට පෙරාතුව ඒ සඳහා ප්‍රධාන ආහාර බලධාරියාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගනු ලැබිය යුතුය."

නියෝග 14. (1)
" ප්‍රධාන ආහාර බලධාරියාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව, කිසිදු ප්‍රචාරණ නියෝජ්‍යායතනයක්, අනුයෝජිතයෙකු, (මුද්‍රිත, ඉලෙක්ට්‍රෝනික, බාහිර යනාදී) වශයෙන් වූ යම් මාධ්‍ය ආයතනයක් විසින් හෝ වෙනත් පුද්ගලයෙකු විසින් ආහාර වල සෞඛ්‍ය හිමිකම්පෑමක් හෝ පෝෂණ පදාර්ථ ක්‍රියාත්මකව හිමිකම්පෑමක් ඇතුළත් කිසිදු ප්‍රචාරණ දැන්වීමක් ප්‍රචාරණය කරනු නොලැබිය යුතුය."
ඉහත නියෝග [13.(6) (අ) සහ 14. (1)] සම්බන්ධයෙන් සිදුවන උල්ලංඝනයන් සම්බන්ධව කිසියම් නීතිමය ක්‍රියා මාර්ගයක් ගැනීමට පෙර අනිවාර්යයෙන් එම උල්ලංඝනයන් පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන පරිපාලන ඒකකය වෙත දැනුම් දී අධ්‍යක්ෂ, ආහාර පාලන පරිපාලන වෙතින් අදාළ කරුණු සත්‍යාපනය කර ගැනීමෙන් අනතුරුව පමණක් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස සියළුම බලයලත් නිලධාරින්ට මෙයින් උපදෙස් ලබා දෙනු ලැබේ.

එබැවින්, රෙගුලාසි 13.(6) (අ) සහ 14.(1) හි විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන නොතිසි, නඩු පැවරීම හෝ වෙනත් ඕනෑම නීතිමය ක්‍රියාමාර්ගයකට පෙර ලිඛිතව අධ්‍යක්ෂ ආහාර පාලන පරිපාලන වෙත යොමු කළ යුතු අතර, එම අධ්‍යක්ෂ වෙතින් පිළිතුරු ලැබීමෙන් අනතුරුව පමණක් ඉදිරි කටයුතු කර ගෙන යා යුතු බව දන්වමි.

වෛද්‍ය අසේල ගුණවර්ධන,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
ප්‍රධාන ආහාර බලධාරි
සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශය.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත ,
කොළඹ 10

පිටපත්:

- ලේකම්, සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශය
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා) I
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාරිසරික, වෘත්තීය සෞඛ්‍ය හා ආහාර ආරක්ෂණ)
- අධ්‍යක්ෂ (ආහාර ආරක්ෂණ පරිපාලන ඒකකය)